

# පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

**"නිවහල් සිතුවිලි** මවනා සිතත් උදාරයි''
නිදහස් දා සංගීත සාදයකට ගිහින් ඇවිත් ටිකක් පමාවෙලා ඇඳට ගිය පන්හිඳට පහුවදා ඇහැරුණේ පණ්ඩිත් අමරදේව තුමාගේ කඩ හඬින්. පින්සල පුරුදු වෙලාවටම ඇහැරිලා නිමල් අල්විස් උන්නැහේගේ පුංචි තිරේ 'උදා දසුන' බල බලයි උන්නෙ.
''මොන තරම් අපූරු කියමනක් ද, ඩෝල්ටන් අල්විස් මහත්තැන් ඒ ලියලා තියෙන්නෙ. ඒ එක පදයම ඇති නිදහස් දා හිතට ගන්න.'' පින් කිව්වේ ''ඇඳ තේ'' එකෙන් තව උගුරක් බොන ගමන්.
''හො - හොප්, හොප්'' පන් නිදි ඇඟ මැලි කඩද්දි ලිහිලා වැටෙන්න ගිය සරම අල්ලා ගත්තා. හොඳ වෙලාවට පින් හිටියෙ පුංචි තිරේ දිහා බලාගෙන.
''මං උන්නා අළුත් සින්දුවක්වත් කියන්න හදනවාවත්ද කියලා.'' පින් ගැස්සිලා බලන ගමන් කිව්වා.
''ඔව් ඉතින් ඔය වාගේ වචනවලටත් ඔය වාගේ තාලයක් දාලා කිව්වොත් ජනප්පිරිය වේවි. ජනප්පිරිය වෙන එකෙයි ජන අප්පිරිය වෙන එකෙයි තියෙන්නෙ බෝම සුළු වෙනසයි'' පන් සීනි කැපිල්ලක් දැම්මේ කාටද මන්දා.
''ඒ වුණාට ඩෝල්ටන් මහත්තැන් කිව්වත් වගෙ නිවහල්ව නිදහස්ව හිතලා අළුත් යමක් කරන්නත් එපායැ. හැමදාම පරණ දේම කාල් ගගා ඉන්නයැ''
''ඒක ඇත්ත. ඒ දේවල් තේරුමක් ඇතිව කෙරෙනවා නම් තමයි වටින්නෙ.''
ඒ කියන කොටම මෙන්න පුංචි තිරේ පුදුම සාදයක තොරතුරු පෙන්නනවා. පින් ඇහේ කාච කුට්ටම තව ටිකක් පළල් කළා.
''අලුත් විදියට හිතලා කරපු තේරුමක් තියෙන වැඩක් ෟ අපි ලියමු.'' පන්ට මූණ කට හෝදා ගන්නත් සිහියක් නෑ වගේ.
පුදුම සාදය ඇරඹුනු ලැබුයේ වේදිකා නාට්‍යය ගීයකිනි. බොහෝවිට වේදිකා නාට්‍යය ගැයෙනුයේ අදාල රංගන ශිල්පී ශිල්පිනියන් විසින් ම වන නිසාවෙන් දෝ අභිනය ද ඊට එක්වන්නේ නිතැතිනි. පැදුරු සාදයක නියාවෙන් ඇරඹී මෙකී සාදයට රැස්වූවන් අතර ඡායාපිටපත් කරන ලද ගී පද මාලා බෙදා දී තිබුණු නිසාවෙන් සැමගේ හඬික් එක්ව නැගුණා වූ හඬේ සුන්දරත්වය වඩාත් ඉහළ නැංවුනා සේය. උත්කෘෂ්ඨතම අවස්ථාවකට එළැඹෙන ගායන හා රංගන හෝරාවේදී කෙමෙන් හඬ පාලනය වන මියැසිය අතරින් සිය හඬ අවදි කළ නිවේදකවරයා පුදුම සාදයේ වග හෙළිකරන්නට විය.
මේ පැදුරු සාදයක් නොවන වගත්, උපහාර උත්සවයක් බවත් කියා සිටියේය. හේ කවුරුන් වෙනුවෙන් ද මේ උපහාරය? පසෙක වූ කුඩා තිරයක බොඳව ගිය සේයා රුව, තියුණු වී පැහැදිලි වෙද්දී නැංවූ රුව වූයේ කලාවේදිනී මාලනී ජයසිංහ මැතිණියගේ රුවයි. දශක ගණනාවක් පුරා මෙවන් සුදු බිමක හෙළ වේදිකා රංග රීතීන්ගේ හරය පිළිබිඹු කරන්නට වේදිකා තිරය පසු පසින් හිඳ කළා වූ අනුපමේය දායකත්වයට උපහාරයයි ඒ. කුඩා කල සිට පෙළ ගැන්වූ ඡායා රූ තිරපටෙහි දිස්වෙද්දී, මව් බිමෙන් ගලා ආ පණිවිඩ කියැවෙද්දී මාලනිය ප්‍රධාන අමුත්තිය වශයෙන් ආසනාරූඪ වූයේ පුදුමයෙන් පලල් වූ නෙති කඳුලැල් උපැස් අතරින් පෙරමිනි. ''පැදුරු සාදයකට'' සුදුසු ශාලාව පවා සොයා දෙමින්, අනෙකුත් ආරාධිතයින් මෙන්ම ප්‍රවේශ පත්‍රයක් ද ගෙන ශාලාවට ඇතුළු වූ ඇය මෙලෙස උපහාර ලැබීම ඇයට පුදුමයක් වුවද අන් අය හට නම් පුදුමයක් නොවේ. කිසිවෙකුගේ සිත නොරිදවා සිනහ මුසු මුවින් සියළු බර කර පින්නාගෙන තිරය පසුපස සැඟවුන ඕ තොමෝ කිසිවිටෙක ප්‍රසිද්ධිය හෝ ප්‍රශංසාව නොපැතුවාය.
මව්බිමේදී ගුරු වෘත්තිය ද අභිබවා නැගී ගිය රංගන කෞෂලය්‍යය මෙපුර දරුවන් අතර වපුලන්නට දිරි දුන් මෑණියකට කෘතගුණය සැලකූ එම ශිල්පී ශිල්පිනියන් පිළිබඳව අභිමානයෙන් සඳහන් කළ යුතුව ඇත්තේ, තමන් වෙනුවෙන් වූ කැපවීමෙහි වටිනාකම හඳුනා ගත් පිරිසක් වූ නිසාවෙනි.
''කලාකාරයෙක් වුණාම පපුව හොඳ වෙන්න ඕන. එතකොට තමයි ඒ අය අතින් සුන්දර දේවල් කෙරෙන්නේ. පිටින් බොරුවට පෙන්නන්න හදන සුන්දරකම බොරුවක් බව කාටත් තේරෙනවා. මාලනී අක්කා ඇත්තටම සුන්දර කෙනෙක්.''පින්ට ලියාගන්න බැරි වුණාට ගුණ කථනයට හරි සූරයා. ගමේදිත් මිනිහට හරියට ආරාධනා.

## පුදුම සාද



මෙරට හුදෙකලා වූ හෙළ රසික රසිකාවන් සති අන්ත රාත්‍රීන් නිදි මරාගෙන තැන තැන පවත්වන සංගීත සාදවල සවතන්ත්‍ර ගී නිර්මාණ එළිදැක්වීම මෙ නුවරුන්ට නැවුම් අත්දැකීමක් ලබාදෙමින් සංගීත ගී තැටි යුගලක් ශිල්පී ශිල්පිනී දෙපලක අතින් දොරට වඩමවනු ලැබීය. පසුගිය නිදහස් දිනයේදී ශ්‍රී පාලී එදිරිසිංහ ශිල්පිනිය ගේ ''සුදු තාරකා'' සහ මිහිඳු මාපා ශිල්පියාගේ ''කිඳුරු කොදෙව්වේ'' ගි සමුච්ඡයන් යුගල මෙනුවර මෙලෙස ශිල්පීන් දෙදෙනෙකු එක්ව එළිදැක්වූ ප්‍රථම අවස්ථාව නොවේද? එක්ව යමක් කිරීමට සිතීම පවා අගය කළ යුතු වන්නේය. ශ්‍රී පාලියගේ ගී එකතුවෙහි ගීත පහක්ම යුග ගායනාවන් වීමද අගය කලයුතු වන්නේ එරට මෙන්ම මෙරට සහෝදර ගායන ශිල්පීන්ට දයාබරව ආරාධනා කරන්නට ඇය සිතූ සිතුවිල්ල නිසාවෙනි. යුග ගායනාවන් ගෙන් සිය ගී එකතු වඩාත් සුන්දර කරවා ගන්නට පණ්ඩිත් අමරදේව, ශිල්පී වික්ටර් රත්නායක වැනි ශිල්පීහු ද නිතර උනන්දු වන්නාහුය. විදේශ ගතව දරු දැරියන් සමඟ ජීවන අරගලයෙහි යෙදෙමින් සිටිනාතුර කෙරෙන කිසිම නිර්මාණයක් ලඝු කොට තැකිය නොහේ. මෙනුවර ශිල්පී ශිල්පිනියන්ගේ නිර්මාණ කරුවන්ගේ දෑ කිසි විටෙක දෙවෙනි තැන්හිලිය නොහැකිමය. 'මහාසාර' මෙ පුර නිර්මාණ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර රංගන වින්‍යාසයන්ට අනුගතව නො ගියේද? අවාසනාවනම් වෙනුවරුන්ම මෙනුවර දෑ සැහැල්ලු කොට තැකීමයි. ගීයක පසුබිමෙහි මූලිකව සිටින පද හා තනු රචකයන් මතු නොව, වාi ශිල්පීන්, පටිගත කිරීමේ ශිල්පීන් වැනි පිරිසකගේ සාමූහිකත්වය පිළිබඳවද, ඉතික්බිතිව මුණ ගැසෙනා, මාධ්‍යවේදීන් විචාරකයින්ගේ සහයෝගය පිළිබඳවද අවසාන සියළු දෑ විඳින රසිකයින්ගේ රුචිකත්වය පිළිබඳවද සිතා බලා කටයුතු කෙරෙන්නේ නම් මෙම නිර්මාණ තව තවත් ඔප් නැංවෙනු නියතය. අන් අය නොව, තමා පිළිබඳව දැන තම කුසලතා වඩවා ගන්නේ නම් මේ දේ වඩ වඩාත් අර්ථාන්විත වනවා නොවේද? ඊට ද මං සැළසී තිබීම වාසනාවකි. වාසනා වීරකෝන් සංගීතවේදිනය විසින් පසුගිය දා ඩැන්ඩිනොංග් කලාගාරයේදී මුල පිරූ 'සංඛ පද්ම' මියැසි හුරුව ගායන කුසලතා නංවා ගත්ත උනන්දු වන්නන්ට සුභ නිමිත්තක්ම වනවා නොඅනුමානය.
'ඔව් ඉතින්' මැති ඇමැති ගොල්ල පලක විවෘත කළත් පාර හදපු කම්කරු මහත්තුරු හරියට වැඩේ නොකළනම් මොකද වෙන්නේ?'' පින් ගේ කටට එන්නේ ඔය වගේ අපභ්‍රන්ස තමා. නිදහස් දවසේ නිවහල් සිතුවිලි ගැන ලියපු ලියවිල්ලට පින් ලෝකයේ තියෙන ප්‍රසිද්ධම නිදහස් ප්‍රතිමාවේ රූපයක් ඇන්ද ඒ පිළිමයට යුද්ධ ඇඳුම් කට්ටලයක් අන්දලා මොකක්දෝ සඟරාවකට නිර්මාණය කරපු පිටකවරයක් දැකලා පින්ගේ හිත කිරි ගැහිලයි උන්නෙ පසුගිය දවස්වල. ■

24 වන පිටෙන්

මේ අනතුරවත් පාඩමකට අරගෙන තවත් මේ වගේ ලෝකයටම වටිනා ජීවිත අකාලයේ විනාශ නොකරන්න නීති ගෙනෙන්න ඕනෑ. ඒක රජයක වගකීමක්.
පූර්ණිගේ මව රටේ පවතින නීතියේ දුර්වලතා ගැනද පවසන්නේ මහත් කණස්සල්ලෙනි.
දුවගේ මේ තත්ත්වය ගැන මානුෂිකව බලල උදව් කරන සංවිධාන බොහෝ තියෙනවා. ඒ අයට මම කාරුණිකව ආරාධනා කරනවා දුවගෙ අනාගතය ගොඩනගන්න උදව්වෙන්න කියලා. ඒ සඳහා ආධාර කරන්න පුළුවන් හැමටම, දුවගෙ සිසු උදාන ගිණුම් අංකයක් තියෙනවා. මහජන බැංකුවේ - මහනුවර නගර ශාඛාවේ, ගිණුම් අංක 00 3200 13150 7125 මේ ගිණුමේ මුදල් ප්‍රයෝජනයට ගන්න පුළුවන් වෛද්‍ය නිර්දේශය මත පමණයි.

මේ ගැන විස්තර කොළඹ ජාතික රෝහලේ ප්ලාස්ටික් ශෛල්‍ය වෛද්‍ය ඒකකයෙන්ම විමසන්නත් පුළුවන්. විශේෂඥ ශෛල්‍ය වෛද්‍ය ධම්මික දිසානායක මහතා ගෙන් හෝ දුරකතන අංක 0714-817427 අංකයට කතා කළත් වැඩි විස්තර දැන ගන්න පුළුවන්.

මේ ශෝචනීය සිද්ධියට මහත් අස්වැසිල්ලක් වෙන්න මේ රටේ මුද්‍රිත මාධ්‍ය අපිට උදව්වට ආවා. දුවගෙ දක්ෂතා ගැන පැහැදුනු බොහෝ පිරිස් ඉන්නවා. ඇගේ අනාගතය ගැන අපට අලුතින් බලාපොරොත්තු ඇති කර ගන්න පුළුවන් විදියේ වාතාවරණයක් ඒ අය තුළින් ගොඩනැගෙයි කියන බලාපොරොත්තුව පමණයි අපට දැන් තියෙන්නේ යැයි පූර්ණිගේ මව අවසන් වශයෙන් අප සමඟ පැවසීය.

මෙවන් කුසලතා පූර්ණ දරු දැරියන්ගේ අනාගතය ශක්තිමත් කරන්නට දායක වන ලෙස අපිදු ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

**චමින්ද සමන් කුමාර**


